ප්‍රජා පාදක වීශෝධන දෙපාර්තමේන්තුව

சமுதாயஞ்சார் சீர்திருத்தத் திணைக்களம்

Department of Community Based Corrections

වාර්ෂික කාර්ය සාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

2024

වාර්ෂික කාර්ය සාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

2024

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
சமுதாயஞ்சார் சீர்திருத்தத் திணைக்களம்
Department of Community Based Corrections

15 වැනි මහල
“මෙහෙවර පියෙස”
නාරාහේන්පිට
කොළඹ-05

15 ஆவது மாடி
“மெஹெவர பியெஸ”
நாராஹேன்பிட்டி
கொழும்பு- 05

15th floor
“Mehewara Piyasa”
Narahenpita
Colombo- 05

011-2683691
www.dcbc.gov.lk
dcbcorrection@gmail.com

කොමසාරිස්තුමාගේ පණිවිඩය



වරදින් මිදුණු යහපත් පුද්ගලයෙකු බිහිකිරීම සිය දැක්ම කරගත් ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව 1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත මඟින් ස්ථාපනය කරන ලද රාජ්‍ය ආයතනයකි.

2024 වර්ෂය තුළදී ආඥාලාභීන් 15,631 ක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය සඳහා අධිකරණය මඟින් යොමු කර ඇත. බන්ධනාගාර තදබදයට විකල්පයක් ලෙස ස්ථාපනය කරන ලද මෙම දෙපාර්තමේන්තුව වෙත අධිකරණ මඟින් යොමු කරන ලද වරදකරුවන්ගෙන් කඩකිරීම් 14% ක් පවත්වාගනිමින් අදාළ නියෝග කාල සීමාව තුළ ඔවුන් වෙනත් වරදක් සිදුකිරීමෙන් වළක්වා ගැනීමට අපගේ නිලධාරීන් සමත්ව ඇත. මෙයට අමතරව 2024 වර්ෂයේ ආඥා සම්පූර්ණ කරන ලද තැනැත්තන්ගෙන් 42%ක් සාර්ථක ලෙස විශෝධනය කර සමාජගත කර ඇත. තවද, පහත කරුණු විශේෂයෙන් සඳහන් කිරීම සුදුසුයැයි හැඟේ.

- අධිකරණය මඟින් ලැබී ඇති නියෝග අනුව ආඥාලාභීන්ගෙන් 86.6% ක ප්‍රමාණයක් මත්පැන් හා මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වන අතර ඔවුන් විශෝධනය කිරීම සඳහා තනි පුද්ගල හා සමූහ උපදේශනය, අධ්‍යාත්මික සංවර්ධන, මත් නිවාරණ උපදේශන හා ප්‍රතිකාර, වෘත්තීය පුහුණු යනාදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය සම්බන්ධ බොහෝ පිරිසක් යහපත් පුද්ගලයින් ලෙස සමාජගත කිරීමට හැකියාව ලැබී ඇත.
- ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පර්යේෂණ අංශයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීමට මේ වන විට කටයුතු කර ඇති අතර විශ්වවිද්‍යාල හා වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත.
- ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය හා සම්බන්ධ ප්‍රජා විශෝධන නිලධාරි, සංවර්ධන නිලධාරි (ප්‍රජා විශෝධන) වැඩ පරීක්ෂක යන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සිදුකර ඇත.
- ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීම හා ඒ සඳහා වූ නව ප්‍රවණතා කෙරෙහි අවධානය යොමු කර ඇත.
    - මත්පැන් හා මත්ද්‍රව්‍ය වරදකරුවන් ලොව පිළිගත් තක්සේරු පරීක්ෂණයක් වන ASSIST අනාවරණ පරීක්ෂණයක් සිදු කර ඒ අනුව වැඩිදුරටත් මත්නිවාරණ ප්‍රතිකාර සඳහා යොමු කිරීම.
    - විශෝධන ක්‍රියාවලිය තුළ අප නිලධාරීන්ගේ මැදිහත්වීම සනිටුහන් කෙරෙන නියෝගලාභී වාර්තා අත් පොතක් සෑම වරදකරුවෙකු වෙනුවෙන්ම ලබා දීම සහ ඒ තුළින් යම් වරදකරුවෙකු පිළිබඳව ඔහු යහමගට ගැනීමට දෙපාර්තමේන්තුව දරණ ප්‍රයත්නය විද්‍යාමාන වීම.
    - දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අභිප්‍රේරණය සඳහා මුල් අදියරේදී කාර්යාල කළමනාකරණ ඇගයීම් වැඩසටහනක් සබරගමුව, ඌව හා මධ්‍යම පළාත් ත්‍රිත්වයේ ක්‍රියාත්මක කිරීම.
- මීට අමතරව දෙපාර්තමේන්තුව වෙත යොමු වන තරුණ වරදකරුවන් වෘත්තීය පුහුණු අවස්ථා වෙත යොමු කිරීමට මෙන්ම රැකියාගත කිරීම් සිදු කිරීමට කටයුතු කිරීම.



දිලාන් ගුණරත්න
කොමසාරිස්
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 326

අන්තර්ගතය

පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
පරිච්ඡේදය 04	-	කාර්ය සාධන දර්ශක
පරිච්ඡේදය 05	-	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව

පටුන පිටු අංකය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය.....1

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර 1

1.3 අරමුණු, ප්‍රධාන කාර්යයන් 2

1.4 සංවිධාන සටහන.....3

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම.....4

2.1 කාර්ය සාධනයට අදාළ තොරතුරු 4

2.2 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01දින සිට 2024.12.31 දක්වා).....8

2.3 එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ ආයතනය (UNODC) මගින් ප්‍රජා පාදක විශෝධනය පිළිබඳව ගරු විනිසුරුවරුන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම..... 9

2.4 ඉලක්ක 11

03 පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය 12

3.1 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය.....12

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 13

3.3 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 14

3.4 මූල්‍ය සටහන් ප්‍රකාශය.....15

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.....16

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.....16

3.7 මු .රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....17

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 17

3.9 විගණකාධිපතිගේ වාර්තාව 18

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය 30

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).....30

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය..... 31

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්කය - 31

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 32

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 32

6.2 කාර්ය මණ්ඩල තොරතුරු.....32

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය.....33

6.4 මානව සම්පත් සංවර්ධනය.....34

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 36

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1999 වසරේදී අධිකරණ අමාත්‍යාංශය යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාව තුළ ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. 1999 අංක 46 දරන ප්‍රජා විශෝධන පනත යටතේ අධිකරණ 3කින් ආරම්භවූ නියමු ව්‍යාපෘතිය මේ වන විට දිවයින පුරා සංචාරක අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ 125ක ක්‍රියාත්මක වේ. සුළු වරදකරුවන් ප්‍රජා විශෝධන ක්‍රියාවලියට යොමු කිරීම තුළින් අධික බන්ධනාගාර තදබදය අඩු කිරීම හා එමගින් වරදකරුවන් නඩත්තුව සඳහා වැයවන අධික වියදම අවම කිරීම, සුළු වරදකරුවන් බන්ධනාගාර ගත කිරීම තුළින් සංවිධානාත්මක අපරාධකරුවන් බවට පත්වීමේ ඉඩකඩ වැළැක්වීම හා ඔවුන් වඩාත් ඵලදායී පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරීම සිදු වේ.

අධිකරණයේ සුළු වරදකරුවකු වූ පුද්ගලයෙකුට ප්‍රජා විශෝධන ආඥාවක් ලබාදීම තුළින් අපේක්ෂා කරනුයේ ප්‍රජාව තුළම තබා ඔහුගේ වරදකාරී චර්යා රටාවෙන් මුදවා, යහපත් පුරවැසියකු බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමයි.

මේ සඳහා මහේස්ත්‍රාත් අධිකරණවල පිහිටුවා ඇති ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් විවිධ විශෝධන වැඩසටහන් සිදුකරනු ලබයි. නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කටයුතු කරන ආඥාලාභියා නිවැරදි මගට යොමුකිරීම දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

විශෝධන ක්‍රියාවලිය අවසන් කරන ලද පුද්ගලයින් පිළිබඳව පසුවිපරම් කිරීම කාලීන අවශ්‍යතාවක් වි ඇති බැවින්, ඒ පිළිබඳවද අවධානය යොමු කරමින් මෙම දෙපාර්තමේන්තුව විසින් ආරම්භයට වඩා දෙපාර්තමේන්තුවේ කාර්ය පරාසය පුළුල් කර ඇත. එම කාර්යයන් සිදුකිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයන්හි පිහිටි ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාලවල සේවයකරන ප්‍රජා විශෝධන නිලධාරී, වැඩ පරීක්ෂක නිලධාරීන්ට අමතරව දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කොට ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

වරදින් මිදුණු යහපත් පුරවැසියෙක්

මෙහෙවර

පසුවිපරමක් සහිත ඵලදායී ප්‍රජා විශෝධන ක්‍රියාවලියක් තුළින් සුළු වරදකරුවන් හා ඔවුන්ගේ පවුල් සමාජීය, ආර්ථික, අධ්‍යාත්මික හා මානසික වශයෙන් සංවර්ධනය කිරීම.


1.3 අරමුණු

1. 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත ක්‍රියාත්මක කිරීම මඟින් සුළු වරදකරුවන් බන්ධනාගාරගත කිරීම වෙනුවට ඔවුන් ප්‍රජාව තුළ තබා විශෝධනය කිරීම
2. ප්‍රජා පාදක විශෝධන ආඥා ක්‍රියාත්මක කිරීම මඟින් සුළු වරදකරුවන් බන්ධනාගාරගත කිරීම අවම කර බන්ධනාගාර තදබදය අඩුකිරීම හා ඒ සඳහා වැය වන රජයේ වියදම අවම කිරීම
3. ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනය සඳහා යොදා ගැනීම
4. ප්‍රජා විශෝධන ආඥාලාභීන් සහ ඔවුන්ගේ පවුල්වල මනෝ සමාජීය ගැටළු අවම කර ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම
5. ඵලදායී ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලියක් තුළින් සමාජගතවන සේවාලාභියා පිළිබඳ පසුවිපරමක් සිදුකර සාර්ථකත්වය මැන බැලීම

ප්‍රධාන කාර්යයන්

1. මහේස්ත්‍රාත් අධිකරණ මඟින් සුළු වැරදිකරුවන් වූ පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධන නියෝග සඳහා ඇතුළත් කිරීම
2. ආඥාලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම
3. ආඥාලාභීන්ගේ මානසික සෞඛ්‍යය වර්ධනය හා උපදේශන වැඩසටහන් සංවිධානය කිරීම
4. ආඥාලාභීන්ගේ විශේෂ හැකියාවන් හා ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
5. ආඥාලාභීන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
6. ආඥාලාභීන් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන්, එම ඇබ්බැහිතාවයෙන් මුදවා ගැනීම සඳහා වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු කිරීම
7. පෞරුෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

1.4 සංවිධාන සටහන


කොමසාරිස් -1
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (මෙහෙයුම්) -2
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (පාලන) - 1
ගණකාධිකාරි - 1
අභ්‍යන්තර විගනක - 1
ජ්‍යෙෂ්ඨ ප්‍ර.වි.නි - 9 (පළාත් කාර්යාල)
ජ්‍යෙෂ්ඨ ප්‍ර.වි.නි - 1 (ප්‍රධානකාර්යාලය)
පරිපාලන නිලධාරී - 1
භාෂා පරිවර්තක - 1
සංවර්ධන නිලධාරී (ප්‍රජා විශෝධන)
ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති
ප්‍රාදේශීය කාර්යාල
ප්‍ර.වි.නි
වැඩ පරීක්ෂක
සංවර්ධනඅංශය
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.කා.ස
පාලන අංශය
සංවර්ධන නිලධාරී
තොරතුරුහා සන්නිවේදන තාක්ෂණ සහකාර
කළමනාකරණ සේවා නිලධාරී
ලිපිකරු
රියදුරු
කා.කා.ස
ගිණුම් අංශය
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
ලිපිකරු
කා.කා.ස

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 කාර්ය සාධනයට අදාළ තොරතුරු


අ) මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් සංඛ්‍යාව - පළාත් අනුව (2024.01.01– 2024.12.31)

අනු අංකය	පළාත	නියෝග ලැබූ ආඥාලාභීන් සංඛ්‍යාව
01	බස්නාහිර	3,740
02	උතුර	2,173
03	වයඹ	1,376
04	නැගෙනහිර	1,631
05	මධ්‍යම	1,679
06	ඌව	1,590
07	සබරගමුව	1,306
08	දකුණ	1,353
09	උතුරු මැද	783
	එකතුව	15,**631**


ආ) මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් සංඛ්‍යාව - වරද අනුව (2024.01.01 – 2024.12.31)

අනු අංකය	වරද	නියෝග ලැබූ සංඛ්‍යාව
01	නීතිවිරෝධී මත්පැන්	5,907
02	හෙරොයින්	2,731
03	ගංජා	2,461
04	රථවාහන වැරදි	830
05	මෙතැම්පිටමින් (අයිස්)	1,503
06	සූදුව	550
07	බීමත්ව අශෝභන ලෙස හැසිරීම	546
08	සොරකම්	149
09	ගෘහස්ත ප්‍රචණ්ඩත්වය	159
10	පාරිසරික වැරදි	34
11	සොරබඩු ලඟතබා ගැනීම	03
12	වංචා	12
13	මහජනසාමය කඩකිරීම්	69
14	කැරලිකෝලහාල	12
15	නීතිවිරෝධී අවි ආයුධ ලඟතබා ගැනීම	11
16	වෙනත්	654
	එකතුව	**15,631**

මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් - පළාත් අනුව
(2024.01.01 – 2024.12.31)



මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් - වරද අනුව
(2024.01.01 – 2024.12.31)



ඇ) විශෝධන ආඥා පිළිබඳව තොරතුරු - (2024.01.01 සිට 2024.12.31 දක්වා)

ලබා දී ඇති ආඥා සංඛ්‍යාව (a)	ආඥාව අවසන් කරන ලද ආඥාලාභීන් සංඛ්‍යාව හා එහි ප්‍රතිශතයක් ලෙස		ලබා දී ඇති ආඥාලාභීන්ගෙන් ආඥා කඩ කළ සංඛ්‍යාව		තව දුරටත් ක්‍රියාත්මක වන සංඛ්‍යාව	
	සංඛ්‍යාව (b)	ප්‍රතිශතය (b/a%)	සංඛ්‍යාව (c)	ප්‍රතිශතය (c/a%)	සංඛ්‍යාව (d)	ප්‍රතිශතය (d/a%)
15,631	6,536	42%	2,111	14%	6,984	45%

ඉ) පවත්වන ලද විශෝධන වැඩසටහන් පිළිබඳව තොරතුරු (2024.01.01 සිට 2024.12.31 දක්වා)

අනු අංකය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගලයින් සංඛ්‍යාව
01	උපදේශන වැඩසටහන් (සමූහ)	4,324	25,885
02	මත් නිවාරණ උපදේශන වැඩසටහන් (සමූහ)	1,633	18,797
03	මත් නිවාරණ ප්‍රතිකාර සඳහා පුද්ගලයින් යොමු කිරීම	3,044	3,897
04	වෘත්තීය පුහුණුව (ඒකල)	312	312
05	වෘත්තීය පුහුණුව (සමූහ)	538	4,446
06	ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් (වෛද්‍ය/ආයුර්වේද වෛද්‍ය)	194	4,032
07	අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	1,296	12,396
08	පවුල් හමු පැවැත්වීම	330	4,276
09	පියවර 12 වැඩසටහන්	231	2,809
10	සෞන්දර්යාත්මක වැඩසටහන් පැවැත්වීම	169	4,117
11	ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම	109	4,681
12	ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	766	9,540
13	රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	444	4,214 (රෝපණය කරන ලද පැළ ප්‍රමාණය)
14	පොදු ස්ථාන පවිත්‍රතා ශ්‍රමදාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	3,433	20,231
15	ගෘහය හා ගෘහ පරිසරය කළමණාකරණය පිළිබඳව පුහුණු කිරීම	658	2,841
16	පවුලේ මූල්‍ය කළමනාකරණය	1,049	3,322
17	ආඥාලාභී ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	68	68
18	ආඥාලාභී පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය ඉහළ නැංවීම	204	948

19	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (ප්‍රජා වැඩ කොන්දේසිය යටතේ ආඥාලාභී ශ්‍රමය යොදා ගැනීම	3	70
20	ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ප්‍රජා මූල සංවිධාන දැනුවත් කිරීම (ග්‍රාම නිලධාරී කොට්ඨාස ආවරණය වන පරිදි)	1,254	33,339
21	ප්‍රජාව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන් පැවැත්වීම	496	12,200
22	රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි)	200	7,658
23	අධිකරණ නිලධාරීන් හා නීතීඥවරුන් දැනුවත් කිරීම	103	630
24	පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම	48	528
එකතුව		**20,906**	**177,023**

- **2024 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවට වෙන් වූ මුදල් යොදවා ආඥාලාභීන් විශෝධනය සඳහා සිදු කරන ලද වැඩසටහන් පිළිබඳව තොරතුරු**

අනු අංකය	වැඩසටහන	වැය කරන ලද මුදල (රු.)
01	උපදේශන වැඩසටහන් (සමූහ)	125,479.00
02	මත් නිවාරණ උපදේශන වැඩසටහන් (සමූහ)	56,100.00
03	මත් නිවාරණ ප්‍රතිකාර සඳහා පුද්ගලයින් යොමු කිරීම	92,950.00
04	වෘත්තීය පුහුණුව (සමූහ)	19,920.00
05	ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් (වෛද්‍ය/ආයුර්වේද වෛද්‍ය)	52,035.00
06	අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	197,195.00
07	පවුල් හමු පැවැත්වීම	193,240.00
08	සෞන්දර්යාත්මක වැඩසටහන් පැවැත්වීම	82,615.00
09	ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම	129,300.00
10	ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	128,885.00
11	ගෘහය හා ගෘහ පරිසරය කළමණාකරණය පිළිබඳව පුහුණු කිරීම	56,350.00
12	ආඥාලාභී පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය ඉහළ නැංවීම	32,180.00
13	ප්‍රජාව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන් පැවැත්වීම	28,940.00
14	රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි)	18,200.00
15	අධිකරණ නිලධාරීන් හා නීතීඥවරුන් දැනුවත් කිරීම	21,450.00
එකතුව		**1,234,839.00**

2.2 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 දින සිට 2024.12.31දක්වා)

- **<u>සාර්ථක ලෙස විශෝධනය වූ පුද්ගලයින් සඳහා පුද්ගල/පවුල් සංවර්ධන වැඩසටහන් යටතේ ස්වයං රැකියා ආධාර ව්‍යාපෘති සිදු කිරීම</u>**

ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින්ගෙන් වැඩි ප්‍රතිශතයක් මත්ද්‍රව්‍ය හෝ මද්‍යසාර සම්බන්ධ වරදකරුවන් වන අතර, එම පුද්ගලයින් ඉන් මුදවා යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා විශේෂ අවධානය යොමු කර එමඟින් මත්ද්‍රව්‍ය සඳහා අබ්බැහි වූ පුද්ගලයන් ඉතා සාර්ථකව විශෝධනය කර ඔවුන් සමාජීය හා ආර්ථික වශයෙන් නඟා සිටුවීම සඳහා කටයුතු කරනු ලබයි. මෙහිදී මොවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරනු ලබන අතර, ඒ සඳහා එක් එක් පුද්ගලයාගේ හැකියාව, කැමැත්ත, වෙළඳපල අනුව, ඔවුන් ස්වයං රැකියා සඳහා යොමු කිරීම මෙමඟින් සිදු කරනු ලබයි. ඒ අනුව මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වරදකරුවෙකු වූ පුද්ගලයෙක් විධිමත් ලෙස උපදේශන ක්‍රියාවලිය හා මත් ප්‍රතිකාර සඳහා යොමු කර වෛද්‍ය උපදෙස් පරිදි නේවාසික/අනේවාසික හෝ සායනික ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබයි. මීට සමගාමීව මෙම පුද්ගලයන්ට තම පවුල තුළ ඉතා විශ්වාසනීය හා ආරක්ෂිත වට පිටාවක් නිර්මාණය කිරීම සඳහා පවුල් සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කර යහපත් පුද්ගලයෙකු ලෙස සමාජ ගත කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. ප්‍රජා විශෝධන ක්‍රියාවලියෙන් පසුව ඉතා සාර්ථකව විශෝධනය වූ ස්ථීර ආදායම් මාර්ගයක් නොමැති මෙවැනි පුද්ගලයින්ට වෘත්තීය නිපුණතාවයක් ලබා ගැනීමට වෘත්තීය පුහුණු වැඩසටන් සඳහා යොමු කරනු ලබයි.

ස්වයං රැකියා ආරම්භ කිරීමට කැමැත්ත හා හැකියාව ඇති පුද්ගලයින් ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විධිමත්ව අධ්‍යයනය කර සුදුසු පුද්ගලයින් හඳුනාගෙන ඔවුන් ඒ සඳහා යොමු කරනු ලබයි.

ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මූලික ප්‍රාග්ධනයක් හෝ සලසා ගැනීමට නොහැකි පුද්ගලයින් සඳහා, මෙම ව්‍යාපෘතිය යටතේ රු. 50,000.00ක උපරිමයකට යටත්ව ආධාර මුදලක් අදාළ ප්‍රාදේශීය ලේකම් මඟින් (උපකරණ හෝ අමු ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා) ලබා දීමට කටයුතු කරනු ලබයි. එමෙන්ම ආඥාලාභීන්ගේ ශ්‍රමය ඵලදායි ලෙස යෙදවීම සඳහා නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කර ඇත. 2024 වර්ෂයේ වෙන් කරන ලද මිලියන 05ක ප්‍රතිපාදන ප්‍රමාණයෙන් නියෝගලාභීන් 67 දෙනෙකු සඳහා හඳුනාගත් ස්වයං රැකියා ව්‍යාපෘති 67ක් ක්‍රියාත්මක කිරීමට අදාළව රු. 3,268,942.45ක මුදලක් ගෙවීම් සිදු කර ඇත. මේ යටතේ කුකුළු පාලනය, ගව පාලනය, එළු පාලනය, පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන, විසිතුරු මත්ස්‍ය වගාව, පැස්සුම් වැඩ, යතුරුපැදි අලුත්වැඩියාව, කෙටිකෑම නිෂ්පාදනය, බුලත් වගාව, මේසන් වැඩ, ධීවර හා කෘෂි භෝග වගාව වැනි ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

- **<u>දුෂ්කරතා සහිත හඳුනාගත් පුද්ගලයින්ගේ පවුල් සුබසාධනය යටතේ දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම</u>**

අඳාලාහී පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය යටතේ දරුවන්ගේ අධ්‍යාපන ආධාර සහ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා පුද්ගලයින් 319 කු වෙනුවෙන් රු. 1,675,973.55ක ප්‍රමාණයක් ගෙවීම් සිදු කර ඇත.

2.3 එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ ආයතනය (UNODC) මගින් ප්‍රජා පාදක විශෝධනය පිළිබඳව ගරු විනිසුරුවරුන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ ආයතනය (UNODC) මගින් ගරු විනිසුරුවරුන් ප්‍රජා පාදක විශෝධනය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා වැඩසටහනක් පවත්වන ලදී. මේ අනුව ප්‍රජා පාදක විශෝධනය පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් ගාල්ලහිදී පවත්වන ලදී. මේ සඳහා ගරු දිසා විනිසුරුවරු/මහේස්ත්‍රාත්වරු 30ක් සහභාගීවූ අතර ඒ තුළින් ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් සිදු කිරීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන් වල සාර්ථකත්වය මත එම ගරු විනිසුරුවරු සහභාගීවූ අධිකරණ වල ප්‍රජා පාදක විශෝධන නියෝග සංඛ්‍යාව වැඩිවීම, පූර්ව දණ්ඩන වාර්තා කැඳවීම, විවෘත අධිකරණයේදී වාර්තා කැඳවීම, විශෝධන නියෝගයන් පිළිබඳව අවධානය යොමු කිරීම, විශෝධන කොන්දේසි පිළිබඳ ගරු විනිසුරුවරුන්ගේ අවධානය යොමු වීම හා එම නියෝග අනුව කටයුතු කරන ලෙස ආඥාලාභීන් ගරු අධිකරණයේදී දැනුවත් කිරීම යන ක්‍රියාමාර්ග මගින් ප්‍රජා පාදක විශෝධන නියෝග ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය වී ඇත. තව දුරටත් ගරු විනිසුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට නියමිතය.







සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 දින සිට 2024.12.31 දක්වා)

ව්‍යාපෘතියේ නම	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)	වැය කරන ලද කාරණය	වැය වූ මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය			
					ආඥාලාභීන් සංඛ්‍යාව	සම්පූර්ණ කරන ලද නියෝග සංඛ්‍යාව	සාර්ථකව විශෝධනය කරන ලද	
							සංඛ්‍යාව	ප්‍රතිශතය
වැරදිකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීම	5,000,000.00	නියෝග ක්‍රියාත්මක කිරීම			15,631	6,536	2,880	44%
		සාර්ථකව විශෝධනය කරන ලද ආඥාලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන සඳහා හඳුනාගන්නා ලද ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා ආඥාලාභී පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය යටතේ දරුවන්ගේ අධ්‍යාපනය හා මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ආධාර ලබා දී ඇත.	5,000,000.00	100%				

2.4 ඉලක්ක

01. සුළු වැරදි සම්බන්ධ වරදකරුවන් වන පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කර ගැනීම, වැඩි කර ගැනීම හා විශෝධන කටයුතුවල සාර්ථකත්වය වැඩි කිරීම

02. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

- ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි හා ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය හා එහි ප්‍රවණතා පිළිබඳව දැනුවත් කිරීම
- සංවර්ධන නිලධාරීන් සඳහා උපදේශනය, මත් නිවාරණය, සමාජ වැඩ මැදිහත්කරණය පිළිබඳ පුහුණු ලබාදීම තවදුරටත් සිදු කිරීම
- සියලුම නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම
- ප්‍රජා විශෝධනය හා ඊට අදාළ වන අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව විදේශීය පුහුණුව ලබාදීම.

03.ප්‍රතිකාර ක්‍රියාවලිය විධිමත් කිරීම

- ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රෝහල් ආශ්‍රිතව)

04. සාර්ථකව විශෝධනය වන ආඥාලාභීන් සුළු පරිමාණ ව්‍යවසායකයන් බවට පත් කිරීම

05. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය මහජනතාවට සමීප කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීම

06. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලියේ තොරතුරු කළමනාකරණය කිරීම සඳහා කටයුතු කිරීම

- වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම
- ආඥාලාභී තොරතුරු කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යෑම

07. ප්‍රජා පාදක විශෝධන පනත සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදු කරමින් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කිරීම


08. ආඥාලාභීන්ගේ බහුතරය මත්පැන් සහ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයන් බැවින් ප්‍රතිකාර ක්‍රමවේදයක් මඟින් පුද්ගලයන් විශෝධනයට ලක් කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම.

09. සංවර්ධන නිලධාරීන් හරහා ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ පසු විපරම් ක්‍රියාවලිය වඩාත් විධිමත්ව තවදුරටත් සිදු කිරීම.

10. ආඥාලාභීන් සාර්ථකව විශෝධනය කිරීමෙන් අනතුරුව වරදින් මිදුණු යහපත් පුද්ගලයින් බවට පත් කිරීම හා ඔවුන්ගේ පවුල් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

03 පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය

3.1 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය



එසිජ්-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		603,431,000	510,666,000	එසිජ්-3
-	කැන්පතු		1,325,966	245,500	එසිජ්-4
-	අත්තිකාරම් ගිණුම්		17,316,773	11,994,061	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**622,073,740**	522,905,561	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**622,073,740**	522,905,561	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		62.29	0.68	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		622,073,677	522,905,560	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
561,145,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	532,685,913	449,031,515	
91,800,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	86,686,689	71,295,035	එසිජ්-2(ii)
3,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	2,519,403	2,703,085	
	පොළී ගෙවීම්	8	-	-	
200,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	65,000	-	
656,145,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**621,957,006**	523,029,635	
	මූලධන වියදම්				
6,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	5,985,118	3,269,183	
61,300,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	26,450,469	1,999,068	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිජ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
3,000,000	හැකියා වර්ධනය	14	2,989,150	1,421,650	
5,000,000	වෙනත් මූලධන වියදම්	15	5,000,000	1,818,250	
75,800,000	මුළු මූලධන වියදම් (උ)		**40,424,738**	8,508,151	
	කැන්පතු ගෙවීම්		1,232,383	381,974	එසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		27,694,630	22,202,630	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		28,927,013	22,584,604	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		691,308,757	554,122,390	
731,945,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(69,235,079)	(31,216,829)	
	අඩිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(69,235,079)	(31,216,829)	එසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අඩිම ශේෂය		(69,235,079)	- (31,216,829)	එසිජ්-3

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	83,032,894	59,016,398
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	54,121,609	43,743,752
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**137,154,503**	**102,760,150**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		53,969,275	43,685,002
දේපළ පිරියත හා උපකරණ සංචිතය		83,032,894	59,016,398
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	152,333	58,750
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**137,154,503**	**102,760,150**

පිටු අංක 1 සිට 24 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 25 සිට 29 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මූදල්)/ කොමසාරිස් (මූදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 28/02/2025	දිනය : 2025/02/20	දිනය : 2025/02/20

ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

දිලාන් ගුණරත්න
කොමසාරිස්
ඵලදායී විගෝධන දෙපාර්තමේන්තුව

ආර්.සල්පඩි පෙරේරා
ගණකාධිකාරි
ඵලදායී විගෝධන දෙපාර්තමේන්තුව

2

3.3 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

එස්ජී-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කණ්ඩායම	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	25,146,595	19,820,565
අග්‍රිම ලැබීම්	603,431,000	510,666,000
අත්තිකාරම් අයකර ගැනීම්	14,037,703	10,397,361
නැන්පතු ලැබීම්	1,325,966	245,500
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**643,941,265**	**541,129,426**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	597,803,502	512,158,318
සහනාධාර සහ මාරුකිරීම්	2,519,403	2,703,085
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	126,143	304,474
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	62.29	0.68
අත්තිකාරම් ගෙවීම්	24,703,758	19,921,137
නැන්පතු ගෙවීම්	1,232,383	381,974
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**626,385,252**	**535,468,988**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**17,556,013**	**5,660,438**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	25,905	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**25,905**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	17,556,013	5,660,438
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**17,581,918**	**5,660,438**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(17,556,013)**	**(5,660,438)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය සටහන් ප්‍රකාශය

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

2024 වර්ෂයට පෙර මිලදී ගෙන ඇතිමුත් 2023.12.31 දින දක්වා ගිණුම් ගත කර නොමැති රු.17,563,795 වටිනා වත්කම් 2024 වර්ෂය තුලදී ගිණුම් ගත කරන ලදී

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

					රු. 000
ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මූලික ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළනැත					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	576,000,000.00	656,145,000.00	621,957,006.00	94.78%
ප්‍රාග්ධන	21,000,000.00	75,800,000.00	40,424,738.00	53.33%


3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන		තත්‍ය වියදම(රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
		මුල් ප්‍රතිපාදන(රු.)	අවසාන ප්‍රතිපාදනය(රු.)		
1	මැතිවරණ කොමිසම	126,143.00	126,143.00	126,143.00	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	වත්කම් කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය(රු.)	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය(රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස
9157	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	83,032,894.00	83,032,894.00	-	100%

3.9 විගණකාධිපතිගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/F/DCBC/FS/04/2024 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි 30 දින

02 JUN 2025

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මූදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මූදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල විධිභාවය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළකර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ මූලධන වියදම් රු.17,581,918ක් වුව ද, එය රු.17,556,013ක් ලෙස රු.25,905ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) ආකෘතිපත්‍ර ඒසීඒ - 6 අනුව වටිනාකම රු.29,200ක් වූ කාර්යාල උපකරණ සමාලෝචිත වර්ෂයේදී අපහරණයකර තිබුණ ද, එම භාණ්ඩවල පිරිවැය වෙනුවට විකිණීමෙන් ලද රු.25,905ක් වූ වටිනාකමට අදාළ තොරතුරු පමණක් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත්කර තිබුණි.

(ආ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 01/2017 හා 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව එක් එක් ආයතනය විසින් මිලදීගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කළ යුතු වුවත්, ආකෘතිපත්‍ර ඒසීඒ - 6 අනුව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම් යටතේ යන්ත්‍ර හා උපකරණ ආරම්භක ශේෂයට රු.17,563,795ක වත්කම් එකතු කරනිබු අතර, ඉන් රු.9,706,405ක වටිනාකමට අදාළ වත්කම් පිළිබඳ තොරතුරු පමණක් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වර්ෂය තුළදී ඉදිරිපත්කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී UNODC ආයතනය විසින් දෙනු ලැබූ විදේශ ප්‍රදානවලින් ලද රු.19,968,568ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණවලට හා එම සංචිතයට ඇතුළත්කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම සඳහා රු.50,000,000ක් පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන්කර තිබූ අතර, ඉන් රු.34,578,585ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් පරිපූරක ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 69ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් 14ක් සඳහා වෙන්කරන ලද රු.73,375,000ක ප්‍රතිපාදනවලින් රු.41,135,005ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. වැය විෂයයන්හි එසේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 11 සිට සියයට 90 අතර පරාසයක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 5ක් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් රු.1,705,000ක් මාරුකර තිබූ අතර, එලෙස මාරුකරගත් ප්‍රතිපාදන උපයෝජනය නොකර රු.451,765ක් එනම් සියයට 10 සිට සියයට 135 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

(ඈ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සලසා ඇති ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 4ක් සඳහා සලසා තිබුණු රු.6,100,000ක ප්‍රතිපාදනයන්ට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කල රු.1,355,000ක ප්‍රතිපාදන මාරුකර තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරුකිරීමේ ප්‍රතිශතය සියයට 9 සිට සියයට 39 අතර පරාසයක් ගෙන තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්, එසේ නොකිරීම හේතුවෙන් මූළු ශුද්ධ ප්‍රතිපාදනය හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය අතර වෙනස ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට (63) සිට සියයට 3,653 අතර පරාසයක පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ආකෘතිපත්‍ර ඒසීඒ-2(ii) හි මූ.රෙ.208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් තීරුව යටතේ මූළු වියදම්වල එකතුව රු.44,476,921ක් වූවද, එය රු.24,508,352ක් ලෙස සටහන්කර තිබුණි.

(උ) විදේශ ප්‍රදාන යටතේ ලද රු.19,968,568ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ දේශීය අරමුදල් යටතේ වූ මූල්‍යකරණයක් ලෙස ඒසීඒ-2(iv) හා ඒසීඒ-2(v) ආකෘතීන්වල සඳහන්කර තිබුණි.

3.2 **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ සහ භාණ්ඩාගාර මූදිත සටහන් (SA 92) තුළ ඇතුළත් නොවූ රු.662,647ක් වූ බැරකම් 2025 වර්ෂයේදී නිරවුල්කර තිබුණි.

3.3 **ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
1 වැනි කාණ්ඩය, V පරිච්ඡේදයෙහි 7.1 ඡේදය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති xv වැනි පරිච්ඡේදයේ 171 හා 172 වගන්ති	ආයතන සංග්‍රහයෙහි අදාළ වගන්ති ප්‍රකාරව, ආයතන ප්‍රධානී වෙත නොදන්වා රාජකාරියට වාර්තා නොකර සිටින නිලධාරියකු සිය තනතුර අතහැර ගියා සේ සලකා ඒ බැව් නිලධරයා වෙත ලියාපදිංචි තැපැලෙන් වහාම දන්වා යැවිය යුතු නමුත්, දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් හත්දෙනෙකු වෙත දෙපාර්තමේන්තුව විසින් තනතුර අත්හැරයාමේ ලිපි නිකුත් කිරීමට මාස 02 සිට අවුරුද්දට වැඩි කාලයක් ප්‍රමාද කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි110	වාහන දෙකකට සිදු වූ හානි පිළිබඳව හානි හා පාඩු පිළිබඳ ලේඛනයෙහි යාවත්කාලීන කර නොතිබුණි.
(ඇ) රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ	
i. 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හි 2 (1) ඡේදය	රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කිරීම කළ යුතු වුවත්, 2024 ජූලි 08 දින සිට අගෝස්තු 13 දින දක්වා ප්‍රධාන කාර්යාලයේ සේවයට වාර්තා කළ නිලධාරියකු එසේ සිදුකර නොතිබුණි.
ii. 2022 සැප්තැම්බර් 15 දිනැති අංක 14/2022 (II) හි 4.14 ඡේදය	වක්‍රලේඛය ප්‍රකාරව පමණක් නිවාඩු අනුමත කිරීම කළ යුතු වුවත්, ඊට පටහැනිව රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි



		සේවය කළ නිලධාරියෙකුට විදේශ නිවාඩු අනුමතකර තිබූ අතර, අදාළ නිලධාරියා රාජකාරි ඉටුකරනු ලැබූ එම තනතුර සමාලෝචිත වර්ෂය තුළදී පූරප්පාඩුව පැවතීම හේතුවෙන් ආඥාලාභීන් පිළිබඳව කිසිදු කටයුත්තක් එම කාර්යාලය තුළින් සිදුවී නොතිබුණි.
iii.	5.1 ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව දේශීය වැටුප් රහිත නිවාඩු ලබාගැනීම සඳහා අදාළ අයදුම්පත ඉදිරිපත් කළ දින සිට මසක් ඇතුළත අවසන් තීරණය ලබාදීමට අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ක්‍රියාකළ යුතු වුවත්, අදාළ තොරතුරු 2024 අගෝස්තු 26 දින අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළද, සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශයෙන් ඊට පිළිතුරු ලබාදී නොතිබුණි.

3.5 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මූදල් චක්‍රලේඛ අංක 01/2020 9.1 (අ) පරිච්ඡේදයට සහ මූදල් රෙගුලාසි 371(5) අනුව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන්කර දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුව ද, නිලධාරීන් 33 දෙනෙකු විසින් අවස්ථා 51කදී ලබාගත් රු.1,320,840ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 11 සිට 222 දක්වා කාලපරාසයක් ප්‍රමාදකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබානොගැනීම

(අ) දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව ලබා ගැනීමට සැලැසුම් කළ නියෝග 15,000කින් නියෝග 12,000ක් වර්ෂය තුළදී අවසන් කිරීමට සැලසුම් කළ ද, වර්ෂය තුළදී නියෝග 6,536ක් එනම් ඇස්තමේන්තු කළ ප්‍රමාණයෙන් සියයට 43ක් අවසන්කර තිබුණි.

(ආ) ප්‍රජා විශෝධන නියෝගයන්ට අදාළ කොන්දේසි සම්පූර්ණ කිරීම සඳහා වර්ෂය තුළදී ක්‍රීඩා වැඩසටහන් 315ක් පැවැත්වීමට සැලසුම් කළ ද, වර්ෂය තුළදී වැඩසටහන් 109ක් එනම් සියයට 34ක් පවත්වා තිබුණි.

(ඇ) ආඥාලාභී ශ්‍රමය යොදාගෙන ආදායම් උත්පාදන ව්‍යාපෘති 9ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ද, සත්‍ය වශයෙන් වර්ෂය තුළදී වැඩසටහන් 03ක් පමණක් එනම් සියයට 33ක් පවත්වා තිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබූ රු.209,858කට අදාළ කාර්යයන් 4ක් වර්ෂය තුළදී ක්‍රියාත්මකකර තිබුණි.

(ඉ) ඇස්තමේන්තුව නිසියාකාරව පිළියෙළ නොකිරීම හේතුවෙන් වර්ෂය තුළදී රු.300,000ක් වැයකර වෛරස් ගාඩ් 223ක් මිලදීගැනීමට සැලසුම් කළ ද, වර්ෂය තුළදී රු.298,894ක් වැයකර වෛරස් ගාඩ් 170ක් පමණක් මිලදීගෙන තිබුණු අතර, රු.1,000,000ක් වැයකර ඇඟිළි සළකුණු යන්ත්‍ර 10ක් මිලදීගැනීමට සැලසුම් කළ ද, වර්ෂය තුළදී රු.569,350ක් වැයකර ඇඟිළි සළකුණු යන්ත්‍ර 5ක් මිලදීගෙන තිබුණි. එමෙන්ම රු.500,000ක් ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදීගැනීමට චෙන්කළ ද, එය මිලදී ගැනීම සඳහා රු.913,320 ක් වැයකර තිබුණි.

4.1.2 **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

අනුරාධපුර, කැකිරාව විශෝධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා වර්ෂය තුළදී රුපියල් මිලියනයක් ඇස්තමේන්තුකර තිබුණ ද, වර්ෂය තුළදී රු.64,215ක් වැයකර අදාළ ඉඩමෙහි මැනුම් කටයුතු පමණක් සිදුකර තිබුණි.

4.1.3 **මුදල් නිදහස්කර තිබුණත්, ප්‍රගතියක් ලබානොතිබුණු ව්‍යාපෘති**

පූත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ 2010 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් රු.1,009,934ක මුදල් වියදම්කර තිබුණ ද, ඉදිකිරීම් කටයුතු අවසන්කර නොතිබුණි.

4.2 **වත්කම් කළමනාකරණය**

(අ) 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ වක්‍රලේඛ අංක 04/2018, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයෙහි 1.3.1 ප්‍රකාරව සෑම වාහනයක් සඳහාම වර්ෂ 05කට වරක් තක්සේරුවක් ලබාගැනීම අනිවාර්යය වුව ද, දෙපාර්තමේන්තුවේ වාහන 04ක් සඳහා එසේ තක්සේරුවක් ලබාගෙන නොතිබුණි.

(ආ) යටෝක්ත මාර්ගෝපදේශයේ 2.3, 3.3.1 සහ 4.3 ඡේද ප්‍රකාරව සෑම වර්ෂ 05කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ සඳහා නැවත තක්සේරුවක් සිදුකළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් එසේ කිරීමට කටයුතුකර නොතිබුණි.

4.3 **රජයේ නිලධාරීන් ඇපකැබීම**

රජයේ නිලධාරීන් ඇප කැබීම පිළිබඳව 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයේ සංශෝධිත මූදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරීන් ඇපකැබීම පිළිබඳව රාජ්‍ය මූදල් ආඥයේ භාරකාරිත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින්, නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන් කර තිබුණ ද, මූදල් රෙගුලාසි 315හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මූදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මූදල් තැන්පත්කර නොතිබුණි.

4.4 **පාඩු හා හානි**

සූත්තලම අධිකරණ පරිශ්‍රයේ කාමරයක් තුළ පවත්වා ගෙන ගිය ප්‍රජා විශෝධන කාර්යාලය 2022 ජූනි 21 දින ඇති වූ හදිසි ගින්නකින් එම කාර්යාලයේ තිබූ පිරිවැය රු.163,302ක් වූ කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබූ අතර, ඒ පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ලේඛනයේ සඳහන්කර නොතිබුණි.

4.5 **කළමනාකරණ දුර්වලතා**

(අ) ප්‍රජා විශෝධන නිලධාරියකු 2019 ඔක්තෝබර් 01 සිට 2023 අගෝස්තු 14 දින දක්වා විදේශ රැකියාවක් සඳහා නිවාඩු ලබා තිබූ අතර, මෙම නිලධාරියාගේ නිවාඩු කාලය අවසන් වී තිබුණ ද, 2023 අගෝස්තු 15 දින සේවයට වාර්තාකර නොතිබුණි. මෙම නිලධාරියාට එදින සිට සේවය අතහැර යාමේ නිවේදනය 2024 ජූනි 04 දින නිකුත් කර තිබුණද, ගිවිසුම් ප්‍රකාරව ඔහුගෙන් අයකරගත යුතු වූ රු.1,106,560ක දණ්ඩන මූදල අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය කාර්යාලවල සේවය කරනු ලබන නිලධාරීන්ගේ පරිපාලන කටයුතු මනා ලෙස කළමනාකරණය නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීන් 04 දෙනෙකු නොදන්වා සේවයට නොපැමිණිය ද රු.200,724 ක මූදලක් වැටුප් ලෙස එම නිලධාරීන්ට ගෙවා තිබූ අතර, එම මූදල් සමාලෝචිත වර්ෂය තුළදී නැවත අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) පූන්තලම් අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය 2022 ජූනි මාසයේ හදිසියේ ඇති වූ ගින්නකින් විනාශ වූ අතර, කාර්යාලයේ තිබූ පරිගණක යන්ත්‍රය හා එහි සියලු කොටස්, ඡායා පිටපත් යන්ත්‍රය, ඇඟිළි සළකුණු යන්ත්‍රය හා අනෙකුත් කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී ද, ඒ සම්බන්ධයෙන් විමර්ශණ කටයුතු ආරම්භකර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින්, විනාශ වූ ස්ථානය වෙනුවට වෙනත් තාවකාලික ස්ථානයක් සොයාගැනීමට හෝ අඩක් ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන්කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

5. **තිරසාර සංවර්ධනය**

5.1 **තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා තිරසර අරමුණක් හඳුනාගෙන තිබූ අතර, එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ඉලක්ක තුනක් පිළියෙලකර තිබුණි. මින් සුළු වැරදි සඳහා වැරදිකරුවන් වී ප්‍රජා විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින්ගෙන් සියයට 40ක ප්‍රමාණයක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයින් බවට පත් කිරීම ඉලක්කකර තිබුණ ද, එහි ප්‍රගතිය සියයට 44ක මට්ටමක පැවති අතර, මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත්ප්‍රතිකාර කිරීම තුළින් ඉන් සියයට 35- 40ක ප්‍රමාණයක් මුදවා ගැනීමට අරමුණුකර තිබුණ ද, එය සියයට 29 පමණ අඩු මට්ටමක පැවතිණි. එසේම ප්‍රජා විශෝධනය සඳහා යොමුකරනු ලබන පුද්ගලයින්ගේ සමාජ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා සාමාජීය, ආර්ථික හා අධ්‍යාත්මික වශයෙන් නහා සිටුවීම අරමුණුකර තිබුණ ද, එම අරමුණ කරා ළඟාවීමේ ඉලක්ක හඳුනාගෙන නොතිබුණි.

6. **යහපාලනය**

6.1 **මහජනයා වෙත සේවා ඉටු කිරීම**

දෙපාර්තමේන්තුව පිළිබඳව තොරතුරු බාහිර පාර්ශ්වයන්ට ලබාගැනීමට වෙබ් අඩවියක් නිර්මාණයකර තිබුණ ද, එය සමාලෝචිත වර්ෂය තුළදී යාවත්කාලීනකර නොතිබුණි.



6.2 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

7.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	06	3	3
තෘතීයික මට්ටම	137	119	18
ද්විතීක මට්ටම	662	622	40
ප්‍රාථමික මට්ටම	12	9	3
එකතුව	817	753	64

(අ) ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳව කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03ක්, තෘතීයික මට්ටමේ පුරප්පාඩු18 ක්, ද්විතීක මට්ටමේ පුරප්පාඩු 40ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 64ක් ද ඇතුලුව සමස්ත පුරප්පාඩු 64ක් පැවතුණි.

(ඇ) එසේම ද්විතියික මට්ටමට අයත් ප්‍රජා විශෝධන නිලධාරී සහ වැඩ පරීක්ෂක තනතුරු 30ක පමණ පුරප්පාඩු පවතින අතර, ඒ හේතුවෙන් ප්‍රාදේශීය විශෝධන කාර්යාලවල කටයුතු නිසිපරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම නිසා ආයතනයේ ප්‍රධාන කාර්යයභාරය වන ආඥාලාභීන් විශෝධනය කිරීමේ කටයුතුවලට බාධාවක් වී තිබුණි.

යූ. එන්. අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට (වැ.බ)

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

කාර්ය සාධන දර්ශකය		ප්‍රගතිය	
		සංඛ්‍යාව	ප්‍රතිශතය
ලබාගත් ප්‍රජා විශෝධන ආඥාලාභීන් සංඛ්‍යාව		15,631	100%
සාර්ථකව විශෝධනය කරන ලද සංඛ්‍යාව	මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන්	912	29%
	වෙනත් වැරදිකරුවන්	1968	58%
නියෝග කඩ කිරීමේ ප්‍රමාණය අවම කිරීම (20%)		2111	14%
පවත්වනු ලබන වැඩසටහන් සංඛ්‍යාව		20,906	100%
ධාරිතා සංවර්ධනය කරන ලද නිලධාරීන් සංඛ්‍යාව		911	100%
වෘත්තීය පුහුණුව ලබා දෙනු ලබන තරුණ වරදකරුවන් ප්‍රමාණය		312	100 %

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම		
	100% -90%	75% - 89%	50% -74%
සමස්ත කාර්ය සාධන දර්ශකය		85%	

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්කය-ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ සැමට යුක්තිය සඳහා සමාන ප්‍රවේශය සහතික කිරීම

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණදර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සුළු වැරදි සඳහා වරදකරුවන් වන පුද්ගලයින්ට අධිකරණයට ඉදිරිපත්වී නීතියට ප්‍රවේශවීමේ සම අයිතිය තහවුරු කිරීම හා එම වැරදිවලින් මිදී යහපත් පුරවැසියන් ලෙස ජීවත්වීම සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීම.	සුළු වැරදි සඳහා වැරදිකරුවන් වී ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයින් බවට පත් කිරීම	සුළු වැරදි සඳහා වැරදිකරුවන් වී ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින්ගෙන් 40% ක ප්‍රමාණයක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයින් බවට පත් කිරීම	44%		
	ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන ලද පුද්ගලයින් අතරින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත් ප්‍රතිකාර කිරීම	මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත් ප්‍රතිකාර කිරීම තුළින් ඉන් 35 – 40% ක ප්‍රමාණයක් ඉන් මුදවා ගැනීම	29%		
	ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන ලද පුද්ගලයින්ගේ සමාජ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා සාමාජීය,ආර්ථික හා අධ්‍යාත්මික වශයෙන් නහා සිටුවීම				

06 පරිච්ඡේදය - මානව සම්පත් පැකිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	6	3	3
තෘතීයික	137	119	18
ද්විතියික	662	622	40
ප්‍රාථමික	12	9	3

6.2 කාර්ය මණ්ඩල තොරතුරු(2024.01.01 -2024.12.31)

අ.අ.	තනතුර		අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
1	ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්	ශ්‍රී ලං.ප.සේ. I	01	01	-
2	සහකාර කොමසාරිස් / නියෝජ්‍ය කොමසාරිස්	ශ්‍රී ලං.ප.සේ.II හෝ III	01	-	01
		දෙපාර්තමේන්තු ගත	02	01	01
3	ගණකාධිකාරී	ශ්‍රී ලං.ග.සේ.II හෝ III	01	01	-
4	අභ්‍යන්තර විගණක	ශ්‍රී ලං.ග.සේ.II හෝ III	01	-	01
5	පරිපාලන නිලධාරී		01	01	-
6	ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී		10	9	01
7	භාෂා පරිවර්තක (දෙමළ)		01	-	01
8	ප්‍රජා විශෝධන නිලධාරී		125	109	16
10	සංවර්ධන නිලධාරී		515	497	18
11	තොරතුරු සන්නිවේදන සහකාර		02	01	01
12	රාජ්‍ය කළමනාකරණ සහකාර ලිපිකරු		20	08 05	07
13	වැඩපරීක්ෂක		125	111 01 *	14
14	කාර්යාල කාර්ය සහායක		08	05	03
15	රියදුරු		04	04	0
එකතුව			**817**	**753**	**64**

*ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මිය ගිය සේවකයෙකුට වැටුප් ගෙවනු ලැබේ

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය

මේ වනවිට දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහල නැංවීම උදෙසා අත්‍යවශ්‍යම තනතුරු සඳහා පුරප්පාඩු පවතී. උදාහරණ ලෙස,

- සහකාර කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ III/II) – 01
- සහකාර කොමසාරිස් - (දෙපාර්තමේන්තුගත) 01
- අභ්‍යන්තර විගනක - 01
- ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී - 01
- භාෂා පරිවර්තක - 01
- ප්‍රජා විශෝධන නිලධාරී - 16
- සංවර්ධන නිලධාරී - 18
- තොරතුරු සන්නිවේදන සහකාර - 01
- වැඩ පරීක්ෂක - 14
- රාජ්‍ය කළමනාකරණ සහකාර - 07
- කාර්යාල කාර්යය සහායක - 03, ලෙස දැක්විය හැකිය.

මේ තත්වය යටතේ දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීමේ බාධා ඇත. විධායක මට්ටමේ තනතුරු පුරප්පාඩු වීම මත ආයතනයේ දැනට සේවයේ නියුතු 753 දෙනෙකුගේ පරිපාලන හා ආයතන කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමටත් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමටත් බාධා සිදු වේ. එමෙන්ම ප්‍රජා විශෝධන නිලධාරී හා වැඩ පරීක්ෂක පුරප්පාඩු වීම හේතුවෙන් ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මත ආයතනයේ ප්‍රධාන කාර්ය භාරය වන ආඥාලාභීන් විශෝධනය කිරීමේ කටයුතු සඳහා බාධා සිදු වේ. ප්‍රමාණවත් පරිදි අධීක්ෂණ මට්ටමේ නිලධාරි නොමැතිකම දෙපාර්තමේන්තුවේ දැක්ම සඳහා ළඟා වීමට බාධාවක් වේ.

ආයතනයක පවතින මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායි ලෙස සේවයේ යෙදවීම සඳහා ධාරිතාවය සංවර්ධනය කළ යුතුය. ඒ අනුව දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත. ඒ සඳහා ආයතනයේ ඉහළ සිට පහළ දක්වා වූ කාර්ය මණ්ඩලය කුසලතාවලින් පරිපූර්ණය කළ යුතු වේ. මෙහිදී එක් එක් නිලධාරී කාණ්ඩයේ රාජකාරි ස්වභාවය අනුව ලබා දිය යුතු කුසලතාවය හඳුනාගෙන එම කුසලතාවයන් ප්‍රගුණ කිරීම සඳහා පුහුණු වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම දෙපාර්තමේන්තුවේ දැක්ම මෙහෙවර අරමුණු ළඟාකරගැනීම සඳහා පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමට අදාළව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබන සුළු වරදකරුවන් වැරදිවලින් මුදවාගෙන යහපත් පුරවැසියෙක් ලෙස සමාජගත කිරීම සඳහා නිලධාරීන්ට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා වන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී පුද්ගලයින්ගේ චර්යාත්මක වෙනසක් ඇති කිරීම හා සමාජ සංවර්ධන කටයුතු සිදු කිරීමට අදාළ දැනුම ලබා දීම සිදු කෙරේ. එමෙන්ම දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු නිසි පරිදි සිදුකර ගැනීමට අවශ්‍ය කාර්යාල කළමනාකරණයට අදාළ ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා 2024 වර්ෂයේ 6.4හි සඳහන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

6.4 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	දින ගණන	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණය	60	දින 02	372,070.00		දේශීය	නිලධාරීන්ගේ දැනුම ආකල්ප හා පෞරුෂ සංවර්ධනය වීම
02	සාමාන්‍ය හැසිරීම, විනය හා කාර්යාල කළමනාකරණය	65	දින 02	245,520.00		දේශීය	
03	පරිගණක සාක්ෂරතාව පිළිබඳව පුහුණු වැඩසටහන	40	දින 05	172,500.00		දේශීය	
04	පවුල් හමු සහ මැදිහත්කරණ පුහුණු වැඩසටහන	70	දින 02	642,648.00		දේශීය	
05	ප්‍රජා විශෝධන ක්‍රියාවලිය සහ එහි නව ප්‍රවණතා පුහුණු වැඩසටහන	60	දින 02	130,746.00		දේශීය	
06	විෂයානුබද්ධ දැනුම සංවර්ධනය	10	දින 02	507,500.00		දේශීය	
07	නවක ප්‍රජා විශෝධන නිලධාරීන් දැනුවත් කිරීම	10	දින 01	16,280.00		දේශීය	

08	ප්‍රජා විශෝධන ක්‍රියාවලිය සහ සංවර්ධන නිලධාරී කාර්යභාරය	80	දින 01	43,638.00		දේශීය	
09	නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය	117	දින 02	497,675.00		දේශීය	
10	වෙනත් පුහුණු වැඩසටහන්			360,573.16		දේශීය	
එකතුව				**2,989,150.16**			

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් නැත	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	ගබඩා අත්තිකාරම් ගිණුම් නැත	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.3	විගණන විමසීම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	යාවත්කාලීන කර ඇත	
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් නොමැත	
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලන සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩ වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් නොමැත	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			

6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව විගණන සැලස්ම සකස් කිරීම	අනුකූල නොවේ	ආයතනයේ විගණන අංශයක් නොමැත.අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ආයතනයේ විගණන අංශයක් නොමැත.අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් නොමැත	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ	2024 වර්ෂයේ කාර්තු 04 සඳහාම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	මේ වනවිට භාණ්ඩ සමීක්ෂණ අවසන් කර අදාළ වාර්තා විගණකාධිපති වෙත යවා ඇත	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	-	එවැනි වාහන නොමැත	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1)ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නො ඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුතු වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂනය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමක් නොමැත.	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමක් නොමැත.	
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමක් නොමැත.	
16	**මානව සම්පත් කළමනාකරණය**			

16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළු සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක/05 2008 හා 05/2018/(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්ම අනුව පුහුණු සැලැස්ම සකස් කර නොමැති අතර වාර්ෂික පුහුණු සැලැස්ම මඟින් සියලුම නිලධාරීන් ආවරණයවේ. නමුත් ලබාදෙන ප්‍රතිපාදන සීමා සහිත බැවින් සියලුම නිලධාරීන්ට පුහුණුව ලබාදීමට නොහැකි වී ඇත.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		